www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ආන්ඩුව ජිනීවා සාකච්ඡා සඳහා ප්‍රකෝපකාරී සූදානමක

## Sri Lankan government makes provocative preparations for Geneva talks

**විජේ ඩයස් විසිනි**
**2005 පෙබරවාරි 21**

ශ්‍රී ලංකා ආන්ඩුවේ සහ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ නියෝජිතයන් අතර පැවැත්වෙන දෙදින සාකච්ඡාව හෙට ජිනීවාහි දී ආරම්භ වීමට නියමිත ය. තියුනු ජාත්‍යන්තර පීඩනයකින් හා දීර්ඝ රාජ්‍යතාන්ත්‍රික වාද විවාද මාලාවකින් පසුව පමනක් එකඟතාව ලබා ගැනුනු මෙම සාකච්ඡා වනාහි තෙවසරකට ආසන්න කාලයකට පසුව ප්‍රථම වතාවට දෙපාර්ශ්වය අතර පැවැත්වෙන සාකච්ඡාවයි.

2002 පෙබරවාරියේ දී අත්සන් කෙරුනු, වඩ වඩා බිඳෙන සුලු තත්වයට පත්ව ඇති, සටන් විරාම ගිවිසුම ගැන කතා කිරීමට පමනක් සාකච්ඡා සීමා වී ඇත. පසුගිය නොවැම්බරයේ දි ජනාධිපති මහින්ද රාජපක්ෂගේ තේරී පත්වීමේ සිට මේ දක්වා, දෙපාර්ශ්වයෙන් ම 200කට අධික සංඛ්‍යාවක් -- මිලිටරි භටයන් සහ එය සමග සහයෝගී සන්නද්ධ කන්ඩායම්වල සාමාජිකයන් සහ එල්ටීටීඊ සටන්කරුවන් හා නිලධාරින් සහ සිවිල් වැසියන් -- මරනයට පත් කරමින් ප්‍රචන්ඩ ක්‍රියා සැලකිය යුතු ආකාරයකින් උත්සන්න වී තිබේ.

සටන් විරාමය "මුලුමනින් ම ක්‍රියාවට දැමීම" පහසු කිරීමේ විධික්‍රම සොයා බැලීමට පමනක් සාකච්ඡා සීමා කල යුතු යැයි එල්ටීටීඊ නායකයෝ අවධාරනය කරති. කෙසේ වෙතත්, කොලඹ මාධ්‍යවලට අනුව, ජනාධිපති රාජපක්ෂ සහ ඔහුගේ එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුව, එල්ටීටීඊය මත නව සීමාවන් පනවන සහ ශ්‍රී ලංකා මිලිටරියේ අත ශක්තිමත් කරන සංශෝධිත ගිවිසුමක් සාකච්ඡාවට ඉදිරිපත් කිරීමේ ප්‍රකෝපකාරි සැලැස්මක් අතැතිව සිටී.

යෝජිත ගිවිසුමේ විස්තර ප්‍රකාශයට පත් කෙරී නැති මුත්, වාර්තා වන පරිදි, එම කෙටුම්පත පිලියෙල කොට ඇත්තේ දෙමල විරෝධී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ ජාතික හෙල උරුමය සමග සමීප ලෙස සහයෝගී නීති විශාරදයන්ගේ උදව්ව ඇතිව ය. ආන්ඩුවේ නිල කොටස්කරුවන් නොවුනත්, ජවිපෙ සහ හෙල උරුමය ජනාධිපතිවරනයට පෙරාතුව රාජපක්ෂ සමග නිල මැතිවරන ගිවිසුම් අත්සන් කල අතර එජනිස ආන්ඩුවට පාර්ලිමේන්තු සහයෝගය ලබා දෙයි.

මැතිවරන උද්ඝෝෂනය තුල දී දෙමල විරෝධී වර්ගෝත්තමවාදය හිතාමතාම ඇවිස්සීමට ක්‍රියා කල ජවිපෙ සහ හෙල උරුමයේ සහයෝගය සහිතව. රාජපක්ෂ මැතිවරනයෙන් යන්තම් ජය ලැබී ය. සටන් විරාම ගිවිසුම "රටට අවාසිදායක" එකක් ලෙස විස්තර කරමින් එය අහෝසි කල යුතු යැයි ඉල්ලා සිටින වගන්තියක් ජවිපෙ සහ ඔහු අත්සන් කල නිල මැතිවරන ගිවිසුමට ඇතුලත් විය. එල්ටීටීඊය මත වඩා තදබල සටන් විරාම කොන්දේසි පැනවිය යුතු යැයි ශ්‍රී ලංකා මිලිටරි ප්‍රධානින් ගනනාවක් ද ඉල්ලා තිබේ.

සෞඛ්‍ය ඇමති නිමල් සිරිපාල ද සිල්වාගේ නායකත්වයෙන් යුත්, ජිනීවා ගිය ආන්ඩුවේ නියෝජිත කන්ඩායමට කැබිනට් ඇමතිවරු සිවු දෙනෙක් ඇතුලත් ය. නාවික හමුදාපති වසන්ත කරන්නාගොඩ, පොලිස්පති චන්ද්‍රා ප්‍රනාන්දු සහ ආරක්ෂක ලේකම්, ජනාධිපතිගේ සොයුරු ගෝඨාභය රාජපක්ෂ ද එයට ඇතුලත් ය.

නව සටන් විරාම ගිවිසුම කෙටුම්පත් කිරීමෙහි නිරත වූ බවට වාර්තා වී ඇති ප්‍රමුඛ පෙලේ නීතිඥයකු වන එච්.එල්. ද සිල්වා නියෝජිත කන්ඩායමට ඇතුලත් වීම අර්ථභාරී ය. 2004 සුනාමියෙන් විපතට පත් ජනතාවට ආන්ඩුවේ හා එල්ටීටීඊයේ ඒකාබද්ධ ආධාර ලබා දෙනු පිනිස ඇති කර ගැනුනු පශ්චාත් සුනාමි මෙහෙයුම් කලමනාකරන ව්‍යුහයට (පී-ටොම්ස්) එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරනයේ නඩුවක් පවරනු පිනිස ජවිපෙ හා හෙල උරුමය සිල්වා යොදා ගත්තේ ය. එල්ටීටීඊය සමග ඇති කර ගැනුනු පී-ටොම්ස් ගිවිසුම ශ්‍රී ලංකා ජාතිය පාවා දීමක් ලෙස සඳහන් කරමින් ජවිපෙ හා හෙල උරුමය එයට දරුනු ලෙස විරුද්ධ විය.

පසුගිය සති අන්තයේ සන්ඩේ ටයිම්ස් පත්‍රයට අනුව, ජවිපෙ සහ හෙල උරුමය, කොලඹ පිහිටි ජනාධිපතිගේ නිල නිවාසය වන අරලිය ගහ මන්දිරයේ පිහිටුවනු ලබන් මෙහෙයුම් මධ්‍යස්ථානයක් සිට දුරකතන මාර්ග

හරහා ජිනීවා සාකච්ඡාවලට සම්බන්ධ වනු ඇත. මෙම මධ්‍යස්ථානය ස්විස්ටර්ලන්තයේ ෂටෝ ද බොසේ මන්දිරයේ සිටින ආන්ඩුවේ සාකච්ඡාකරුවන් වෙත සෘජු සම්බන්ධයක් සම්පාදනය කොට, ජනාධිපතිට හා ඇමතිවරුන්ට හෙල උරුමයේ හා ජවිපෙ නියෝජිතයන් හා එක්ව, මූලික වසයෙන් දොරගුලු ලාගෙන පැවැත්වෙන, සාකච්ඡාවල ප්‍රගතිය නිරීක්ෂනය කිරීමේ අවස්ථාව ලබා දෙනු ඇත.

ජවිපෙ හා හෙල උරුමය සාකච්ඡා ක්‍රියාදාමයට ඇතුලත් කර ගැනීම අතිශයින් ම දහනශීලී ය. දෙපාර්ශ්වය ම නෝර්වේජියානු පහසුකම් යටතේ පැවැත්වෙන සාම සාකච්ඡාවන්ට සතුරු අතර එල්ටීටීඊයට දෙනු ලැබෙන ඕනෑම සහනයක් පරිපූර්න රාජ්‍ය ද්‍රෝහී ක්‍රියාවක් ලෙස සලකයි. පසුගිය සිකුරාදා හෙල උරුමයේ නායක එල්ලාවල මේධානන්ද නම් භික්ෂුව ප්‍රකාශ කලේ, සාකච්ඡා අසාර්ථක වුව හොත් ආන්ඩුව යුද්ධයට සූදානම් විය යුතු බව යි. "ප්‍රභාකරන් මිය ගිය හොත් ශ්‍රී ලංකාව වඩා හොඳ තැනක් වනු ඇත. ඔහු සාම ක්‍රියාදාමයට විශාල බාධාවකි. අපි ඔහුගේ බලපෑම සමාජයෙන් ඉවත් කල යුතු ය." යැයි ඔහු රොයිටර් ප්‍රවෘත්ති සේවයට පැවසී ය.

සටන් විරාම ගිවිසුමේ කිසිදු සංශෝධනයක් සිදු නොවනු ඇතැයි එල්ටීටීඊය තදබල ලෙස කියා සිටී. එල්ටීටීඊ ප්‍රධාන සාකච්ඡාකරු ඇන්ටන් බාලසිංහම් පසුගිය සති අන්තයේ සන්ඩේ ලීඩර් පත්‍රයට මෙසේ පැවසී යඃ "සටන් විරාම ගිවිසුමට කෙරෙන කිසිදු සංශෝධනයක් හෝ ඇමිනුමක් අපි පිලි නොගනිමු. ඒ වෙනුවට අප අවධාරනය කරන්නේ ගිවිසුමේ වගන්ති හා කොන්දේසි මුලුමනින් ම ක්‍රියාවට දැමිය යුතු බව යි." මිලිටරිය සමග සහයෝගීව ක්‍රියා කරන විවිධ පැරා මිලිටරි කන්ඩායම් නිරායුධ කිරීමටත් සන්නද්ධ හමුදා විසින් තවමත් පවත්වා ගෙන යනු ලබන සැලකිය යුතු මට්ටමකින් විශාල අධි ආරක්ෂක කලාප අහෝසි කිරීමටත් ශ්‍රී ලංකා ආන්ඩුව ක්‍රියා කල යුතු යැයි එල්ටීටීඊය අවධාරනය කිරීමට ඉඩ ඇත.

එල්ටීටීඊය විශේෂයෙන් ම උත්සුක වන්නේ 2003 දී එල්ටීටීඊයෙන් බිඳී ගිය කරුනා නමින් ද හැඳින්වෙන වී. මුරලිදරන්ගේ නායකත්වයෙන් යුත් පැරා මිලිටරි කන්ඩායමක ක්‍රියාකාරකම් පිලිබඳව ය. කරුනා කන්ඩායම දිවයිනේ නැගෙනහිර පලාතේ ක්‍රියාත්මක වන අතර සිය සාමාජිකයන් හා ආධාරකරුවන් ගනනාවක් ම මරා දැමීම පිලිබඳව එල්ටීටීඊය ඔවුනට දොස් පවරයි. ආන්ඩුවේ ප්‍රතික්ෂේප කිරීම් නොතකා, එල්ටීටීඊයට එරෙහි ප්‍රහාරවල දී කරුනා කන්ඩායම සහ මිලිටරියේ කොටස් අතර පවත්නා රහස් සහයෝගිතාව පිලිබඳ සාක්ෂි දිගට ම ඉස්මත්තට එමින් තිබේ. වත්මන් සටන් විරාමයට අනුව, සිය පාලනය යටතේ පවත්නා ප්‍රදේශ ඇතුලත ක්‍රියාත්මක වන ඕනෑම කන්ඩායමක් නිරායුධ කිරීමේ වගකීම ආන්ඩුවට පැවරෙයි.

සාම සාකච්ඡා යලි ඇරඹීමෙහි යෙදී ගැනීමට කොලඹ ආන්ඩුවට බලපෑම් දමන ලෙස, පසුගිය නොවැම්බරයේ ජනාධිපතිවරනයෙන් අනතුරුව, ප්‍රභාකරන් "ජාත්‍යන්තර ප්‍රජාවට" ආයාචනා කලේ ය. නව රාජපක්ෂ ආන්ඩුව "සාධාරන දේශපාලන රාමුවක් සහිතව ඉක්මනින් ම ඉදිරියට පැමිනීමට" අපොහොසත් වුව හොත් එල්ටීටීඊය "(දෙමල) නිජභූමියක් තුල ස්වයං-පාලනයක් තහවුරු කර ගැනීමේ ස්වයං-නිර්නය සඳහා අරගලය" උත්සන්න කරනු ඇතැයි නොවැම්බර් 27 දා සිය වාර්ෂික මහා වීර දින කතාවේ දී ඔහු අනතුරු ඇඟවී ය.

කෙසේ වෙතත්, දෙසැම්බර් සහ ජනවාරි මාසවල ප්‍රචන්ඩ ක්‍රියා තියුනු ලෙස ඉහල ගිය තතු තුල, මහ බලවත්තු -- විශේෂයෙන් ම එක්සත් ජනපදය -- ශ්‍රී ලංකා ආන්ඩුවේ පැත්ත ගෙන එහි "ඉවසීම" ගැන ප්‍රශංසා කලේ එල්ටීටීඊය හෙලා දකිමිනි. ජනවාරි මැද දී, එක්සත් ජනපද තානාපති ජෙෆ්රි ලන්ස්ටට් එල්ටීටීඊයට අනතුරු අඟවමින් කියා සිටියේ එය සාකච්ඡා මේසයට යලි පැමිනීමට අසමත් වුව හොත් "වඩා ශක්තිමත්, වැඩි හැකියාවකින් යුක්ත හා වඩා අධිෂ්ඨානවත් ශ්‍රී ලංකා මිලිටරියකට" මුහුන දීමට එයට සිදු වනු ඇති බව යි. ඉන් අනතුරුව සිදු වූ කොලඹ සංචාරයක දී එක්සත් ජනපද සහකාර රාජ්‍ය ලේකම් නිකොලස් බර්න්ස් එල්ටීටීඊය හංවඩු ගැසුවේ "රට යුද්ධයේ ඉස්මත්තෙහි තබා ගෙන සිටින නින්දිත කන්ඩායමක්" ලෙස ය.

එක්සත් ජනපදය අඩු මට්ටමින් ක්‍රියා කරන බවක් පෙනී ගියත් එය ජිනීවා සාකච්ඡා සූදානම් කිරීමෙහි ලා සැලකිය යුතු ක්‍රියාකලාපයක් ඉටු කරයි. එක්සත් ජනපදයේ හාවර්ඩ් ව්‍යාපාරික විද්‍යාලයේ කොටසක් ලෙස 1979 දී පිහිටුවන ලද චින්තන පර්ශදයක් වන හාවර්ඩ් සාකච්ඡා ව්‍යාපෘතිය වෙතින් කුලියට ගත් කන්ඩායමක් ආන්ඩුවේ නියෝජිත කන්ඩායමට තීව්‍ර පුහුනු පාඨමාලාවක් පවත්වා ඇත.

දකුනු ආසියාව තුල වැඩෙන එක්සත් ජනපද ආර්ථික හා මුලෝපායික අවශ්‍යතාවන්ට වල කැපීමේ තර්ජනය මතු කරන දිවයිනේ 20-අවුරුදු සිවිල් යුද්ධය සාකච්ඡා මාර්ගයෙන් අවසන් කිරීමේ පිලිවෙත සඳහා බුෂ් පාලනාධිකාරය තවමත් නිල වසයෙන් තල්ලුව සපයයි. ජනාධිපති බුෂ්, විශේෂයෙන් ම ඉන්දියාව සමග වඩා සමීප සබඳතා තහවුරු කර ගැනීම පිනිස, ඊලඟ මස කලාපයේ සංචාරයක යෙදීමට නියමිත ය. කෙසේ වෙතත්, තානාපති ලන්ස්ටඩ්ගේ ප්‍රකාශ මගින් පැහැදිලි වන්නේ, සාකච්ඡා අසාර්ථක වුව හොත්, එල්ටීටීඊයට එරෙහිව යලි ඇරඹෙන යුද්ධයක දී ශ්‍රී ලංකා සන්නද්ධ

හමුදාවන්ට සහයෝගය දීමට එක්සත් ජනපදය සලකා බලන බවයි.

මොන යම් හෝ අවසන් සාම ගිවිසුමක් පිලිබඳව එල්ටීටීඊය සහ රාජපක්ෂ අතර පුලුල් මතභේද පවතී. යුද්ධය අවසන් කෙරෙන යම් එකඟතාවක් පාදක වනු ඇත්තේ 2002 හා 2003 දී පැවති පෙර සාකච්ඡා වටවල දී සාකච්ඡාවට භාජනය කෙරුනු ආකාරයේ ෆෙඩරල් විසඳුමක් මත නොව, "ඒකීය රාජ්‍යය" මත යැයි, නොවැම්බර් මැතිවරන ව්‍යාපාරය තුල දී රාජපක්ෂ ප්‍රකාශ කලේ ය. පසුගිය සතියේ දී *රොයිටර්* ප්‍රවෘත්ති සේවය සමග පැවති සම්මුඛ සාකච්ඡාවක දී ජනාධිපති ආතතීන් අවුලුවාලමින් මෙසේ කියා සිටියේ යඃ "පවතින්නේ එක රටකි, අපට බලය බෙදිය හැකි ය. වෙනම රාජ්‍යයක් නොවේ. එම අදහස ඉවත් කර ගත යුතු ය. . . . එය මුලුමනින් ම අදාල නැත."

එල්ටීටීඊය එයට කෝපාන්විතව ප්‍රතිචාර දක්වමින් මෙසේ ප්‍රකාශ කලේ යඃ "බිම් මට්ටමේ යථාර්ථයට පරිවර්තනය කල හොත්, ඒකීය රාමුවේ ආන්ඩුව යන්නෙන් අදහස් කෙරෙන්නේ, සිංහල පාර්ලිමේන්තුවක්, සිංහල ව්‍යවස්ථාවක්, සිංහල අධිකරනයක්, සිංහල නිලධරයක් සහ සිංහල සන්නද්ධ හමුදාවන් රට පාලනය කරන බව යි. දෙමල ජනතාව කෘර ජනඝාතනයකට දිගට ම මුහුන දෙන්නේ, මෙම සංකල්පීය ලෙස දෘඩ ආධිපත්‍ය-කෙන්ද්‍රීය ඒකීය ව්‍යවස්ථාව තුල ය."

කොලඹ සංගත ප්‍රභූන්ට, විදේශ ආයෝජනයන්ට හා භූගෝලීයකෘත නිෂ්පාදන ක්‍රියාදාමයන්ට දිවයින ඒකාග්‍ර කිරීමට බාධාවක් බවට පත්ව ඇති යුද්ධය අවසන් කිරීමක් අවශ්‍යව තිබේ. කෙසේ වෙතත්, ඒ පිලිබඳව එතරම් ඉහල බලාපොරොත්තු නැත. කොලඹ කොටස් වෙලඳ පොල තවමත් නොසන්සුන් තත්වයේ පවතී. සිය නිවසේ පොල්තෙල් පහනක් දල්වා ජිනීවා සාකච්ඡා සාර්ථක වන ලෙස යාඥා කරන්නැයි මහජනතාවගෙන් ඉල්ලා සිටීමට වැඩි දෙයක් ලංකා වෙලඳ මන්ඩලයට කරන්ට තිබුනේ නැත.

එම සර්ව-අශුභවාදී මනෝගතියෙන් ම යුක්තව, පසුගිය සති අන්තයේ *සන්ඩේ ටයිම්ස්* කතුවැකියේ ශීර්ෂ පාඨය වූයේ "ජිනීවාවලින් බොහෝ දේ බලාපොරොත්තු වෙන්න එපා" යන්නයි. දෙපාර්ශ්වය අතර පවත්නා පරතරය සහ සාකච්ඡාවල පරිමාවේ සීමිත බව සටහන් කර ගැනීමෙන් පසුව, පුවත් පත "ලකුනු දමා ගැනීමේ විවාදවලට කාලය වැය නොකරන ලෙස දෙපාර්ශ්වයට මේ ආයචනා කලේ ය." ජිනීවාහි අභියෝගයන් කෙතරම් අසීරු වුවත්, අවම රේඛාව වන්නේ ඝාතන නතර විය විය යුතු ය යන්න යි. සාම ක්‍රියාදාමයේ මෙම අදියරේ දී ඔවුන්ට (මහජනතාවට) මීට වඩා යමක් බලාපොරොත්තු විය නොහැකි ය."

මෙම සීමිත එල්ලය පවා බාධාවන්ගෙන් ගහන ය. ව්‍යාපාරික කොටස් යුද්ධය නතර කර ගැනීමේ අවශ්‍යතාවයෙන් පෙලෙනවා විය හැකි නමුදු, කොලඹ පාලක ප්‍රභූහු, කම්කරු පන්තිය බෙදීමට ද සිය පාලනයට මුක්කුවක් ලෙස ද නිදහසේ පටන් මේ දක්වා තමන් වාරු වී ඇති සිංහල අධිපතිවාදී දේශපාලනයෙන් බිඳී ගැනීමේ ඓන්ද්‍රීය නොහැකියාවෙන් පෙලෙති. රාජපක්ෂගේ ප්‍රකෝපකාරී ආස්ථානය සහ ජිනීවා සාකච්ඡා සූදානම් කිරීම තුල ජවිපෙට හා හෙල උරුමයට දී ඇති පුමුඛතාව මගින් යෝජනා කෙරෙන්නේ, සාකච්ඡා, යුද්ධයට සාකච්ඡාමය විසඳුමක් වනවාට වඩා, යුද්ධයට පූර්විකාවක් වීමට වඩා ඉඩ ඇති බව යි.

© www.wsws.org